75

# නවවන, දහවන ශ්‍රේණිවල සමාජ අධ්‍යයනය සම්මත පරීක්ෂණයක් පිළියෙල කිරීම හා සම්මතීකරණය

පී.බී.එම්. හේමා ඒකනායක විසිනි

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පිඨයේ අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධ අවශ්‍යතා අර්ධ වශයෙන් පුරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනයකි.

1981 දෙසැම්බර්

නිබන්ධන උපදේශක : ආචාර්ය එම්.යූ. සේදර

376211

සාරාංශය:

ශ්‍රී ලංකාවේ පාසැල් මට්ටමේ ව්‍යවහාරය සඳහා සම්මතිකරණය කළ සාධන පරීක්ෂණ ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවකි. සමාජ අධ්‍යයනය විෂයය පිළිබඳ නවවැනි හා දහ වැනි ශ්‍රේණි මට්ටමේහි ව්‍යවහාරයට ගැනීම සඳහා වාස්තවික බහුවරණ පරීක්ෂණයක් සම්මතිකරණය කොට මෙයින් ඉදිරිපත් කෙරේ.

මහනුවර, මාතලේ හා නුවරඑළිය පාසැල් දිස්ත්‍රික්කයන්ගෙන් ග්‍රාමීය/නාගරික වශයෙන් හා ස්ත්‍රී/පුරුෂ වශයෙන් තෝරාගත් 700 ක පමණ වූ දහවන ශ්‍රේණියේ සිසුන් යොදාගෙන නවවන හා දහවන ශ්‍රේණි සඳහා නියමිත සමාජ අධ්‍යයන විෂය නිර්දේශය මත තනන ලද විශාල ප්‍රශ්න සංඛ්‍යාවක් ප්‍රාථමික පරීක්ෂණයකට හා වනු විශ්ලේෂණයකට ලක්කොට පරීක්ෂණ වනු 175 කින්සුත් වලංගුතාවෙන් හෙබි සම්මත පරීක්ෂණයක් ගොඩ නැගින.

පරීක්ෂණය හා බැඳි තාක්ෂණික තොරතුරු වශයෙන් විෂය කරුණු වලංගුතාව, සංරචක වලංගුතාව හා සංගාමී වලංගුතාව මෙහි විමසා ඇත. විශ්වසනීයතාව KR 20 හා 21 යොදා ගෙන කුඩා නියැදීන් සඳහා මෙන්ම විශාල නියැදීන් සඳහා ඇස්තමේන්තු කෙරින. ඒ වටා ඇස්තමේන්තුවේ සම්මත වරද ගනනය කොට දක්වා ඇත.

පරීක්ෂණ ව්‍යවහාරයට ගැනීමේ පහසුව සඳහා ලකුණු පැවරීමේ හා බැඳි උපදෙස් වලට අමතරව ඒ ඒ ලකුණු අර්ථ කථනය සඳහා ප්‍රතිශතක ප්‍රතිමාන ස්ටේනයින් ප්‍රතිමාන හා පුවර්ග ප්‍රතිමාන හා ඒවා කියවීම හා උපදෙස් ද ඉදිරිපත් කොට ඇත.